

# පද පොත

(1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය තෙක්)

හෂාන් එදිරිසිංහ

Nation Dip: in Teaching(Primary)Merit

# පද පොත


## හෂාන් එදිරිසිංහ

කතෘ

**මහනුවර ධර්මරාජ විද්‍යාලය**

**3 ශ්‍රේණිය ( පන්තිභාර ගුරුතුමා)**


**2025-02-08**


ISBN 978-624-208-623 - 1

# පිදුම

දසමස කුස හොවා මා මෙලොවට බිහිකළ මගේ

මෑණියන්ට, අවුරුද්දේ දින **365** අපි වෙනුවෙන් දහඩිය

හෙලන මගේ පියාණන්ට, එකුස උපන් මගේ

සහෝදරයන් හතර දෙනාට මෙන් ම මට යෝධ

ශක්තියක් වන බිරිඳට වොසඳි,යොසඳ මගේ දුවට හා

පුතාට මේ පොත පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ම ආදී කතෘ කරුදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමාන ය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# සමානාර්ථ පද

## 1 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| ගස | - | රුක |
| තාත්තා | - | පියා |
| අහස | - | ගුවන |
| අම්මා | - | මව |
| ඉර | - | හිරු |

## 2 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| පාසල | - | විදුහල |
| පාර | - | මාර්ගය |
| ඔළුව | - | හිස |
| ගෙදර | - | නිවස |
| තරු | - | තාරකා |

## 3 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| රාත්‍රිය | - | රැය |
| ප්‍රවෘත්තිය | - | පුවත |
| දූපත | - | දිවයින |
| කැලෑව | - | වනය |
| ඇස් | - | නෙත් |

## 4 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| උදෑසන | - | හිමිදිරිය |
| කුරුල්ලා | - | පක්ෂියා |
| පාදය | - | කකුල |
| වතුර | - | ජලය |
| පොත | - | ග්‍රන්ථය |

## 5 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| රාත්‍රිය | - | රැය |
| අවුරුද්ද | - | වසර |
| අර්ථය | - | තේරුම |
| නෙළුම් මල | - | සියපත |
| ප්‍රසිද්ධ | - | ප්‍රකට |

# විරුද්ධාර්ථ පද

## 1 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| උඩ | - | යට |
| ලොකු | - | පොඩි |
| උස | - | මිටි |
| මහතයි | - | කෙට්ටුයි |
| කැමති | - | අකමැති |

## 2 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| යනවා | - | එනවා |
| ඉදිරිපස | - | පිටුපස |
| පිපෙනවා | - | පරවෙනවා |
| ඉහළ | - | පහළ |
| පිරිසිදු | - | අපිරිසිදු |

## 3 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| කීකරු | - | අකීකරු |
| ගැළපෙන | - | නොගැළපෙන |
| සෙමෙන් | - | වේගයෙන් |
| ප්‍රශ්න | - | පිළිතුරු |
| පුරුදු | - | නුපුරුදු |

## 4 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| යහපත් | - | අයහපත් |
| ආරම්භය | - | අවසානය |
| දිරන | - | නොදිරන |
| සුදුසු | - | නුසුදුසු |
| ලස්සන | - | අවලස්සන |

## 5 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| පැමිණීම | - | නොපැමිණීම |
| අවශ්‍ය | - | අනවශ්‍ය |
| පුහුණු | - | නුපුහුණු |
| වැරදි | - | නිවැරදි |
| අලුත් | - | පරණ |

# යුගල පද

## 3 ශ්‍රේණිය

ගමන් බිමන්

අහල පහල

සිරිත් විරිත්

තෑගි බෝග

කෑම බීම

## 4 ශ්‍රේණිය

පොත් පත්

ගෙවල් දොරවල්

යාන වාහන

වතු පිටි

කෙළි සෙල්ලම්

## 5 ශ්‍රේණිය

අනම් මනම්

විහිළු තහළු

වාද විවාද

අරුම පුදුම

අස්සක් මුල්ලක්

# ප්‍රස්තාව පිරුළු

## 3 ශ්‍රේණිය

### ළිඳේ ඉන්න ගෙම්බා වගේ

තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැති ව සිටීම.

### ඉදිකටුවයි නූලයි වගේ

සැමවිටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම.

### මඩේ හිටවපු ඉන්න වගේ

එක තීරණයක නොසිටීම.

### ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ

කෙනෙකුගෙන් කෙසේ වත් ලබාගත නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම.

### පරංගියා කෝට්ටේ ගියා වගේ

කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යෑම.

## 4 ශ්‍රේණිය

### කළුවා මාරපන් ගියා වගේ

විමසීමකින් තොර ව යමක් කිරීම.

### ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ

අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම.

### කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ

නුසුදුස්සාට තනතුරු/වරප්‍රසාද දීමෙන් අහංකාර වීම.

### ඉඟුරු දී මිරිස් ගත්තා වගේ

යම් අපහසුතාවකින් හෝ කරදරයකින් හෝ මිදීමට කරන ක්‍රියාවෙන් වඩාත් කරදරයකට හා අපහසුතාවට පත් වීම.

### කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ

තීරණ ගැනීමේ දී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම.

## 5 ශ්‍රේණිය

### ගඟට ඉනි කැපුවා වගේ

දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.

### රයිගමයයි ගම්පළයයි වගේ

ගැළපෙන අදහස් හා ගතිගුණ තිබීම.

### නරියා මිදි තිත්තයි කිවුවා වගේ

යමක් කිරීමට උත්සාහ කර එය කර ගත නොහැකි විට එහි අගුණ කීම.

### කට නිසා ඉබ්බා නැහුණා වගේ

සුදුසු නුසුදුසු දේ විචාර බුද්ධියෙන් නොවිමසා කතා කිරීම.

### මහදැනමුත්තාගේ නුවණ වගේ

අදූරදර්ශී උපදෙස් දීම.

# ඉඟිවැකි ( රූඩී )

## 4 ශ්‍රේණිය

### එක හුස්මට

- යම් කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම.

### අකුරක් නෑර

- කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම.

### ඉහේ මලක් පිපුණා

- දැඩි සතුටකට පත් වීම.

### අනූ නවයෙන් බේරුණා

- යම් විපතකින් යාන්තමින් ගැළවීම.

### මොර සූරන වැස්ස

- අධික වර්ෂාව

## 5 ශ්‍රේණිය

### ඇඟ බේර ගන්නවා

වගකීමෙන් බේරීම.

### හීන් දාඩිය දැම්මා

දැඩි සේ බියට පත්වීම.

### අහසේ මාලිගා

ඉටු නොවන සිහින මැවීම.

### අබමල් රේණුවක්

ඉතා ම කුඩා ප්‍රමාණයක්

### මුරුංගා අත්තේ තියනවා

රවටනු පිණිස වර්ණනා කිරීම.

# ආප්තෝපදේශ

## අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න

අද කළ යුතු දේ අද ම කරන්න. හෙටට කල් නොදමන්න.

## ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න

ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න.

## පනින්න පෙර සිතා බලනු

යමක් කිරීමට පෙර සිතා බලන්න.

## ඇවිළෙන ගින්නට පිදුරු නොදමන්න

ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න.

## උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා

උගත් ශිල්පය ම මතු ආරක්ෂාව සලසයි.

# ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග පද

## 1 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| අම්මා | - | තාත්තා |
| ආච්චී | - | සීයා |
| ගිරවී | - | ගිරවා |
| නංගී | - | මල්ලී |
| කිරිල්ලී | - | කුරුල්ලා |

## 2 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| රැජින | - | රජ |
| කිකිළි | - | කුකුළා |
| ගුරුතුමිය | - | ගුරුතුමා |
| දුව | - | පුතා |
| වෛද්‍යවරිය | - | වෛද්‍යවරයා |

## 3 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| විදුහල්පතිතුමිය | - | විදුහල්පතිතුමා |
| ශිෂ්‍යාව | - | ශිෂ්‍යයා |
| මුව දෙන | - | මුවා |
| සිංහ ධේනුව | - | සිංහයා |
| මිතුරිය | - | මිතුරා |

# 4 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| යෙහෙළිය | - | යහළුවා |
| නිළිය | - | නළුවා |
| ඇතින්න | - | ඇතා |
| කොටි දෙන | - | කොටියා |
| සහෝදරිය | - | සහෝදරයා |

# 5 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| ලේඛිකාව | - | ලේඛකයා |
| කිවිදිය | - | කවියා |
| ගෙවිලිය | - | ගොවියා |
| ඇය | - | ඔහු |
| දැරිය | - | දරුවා |

# ඒකවචන හා බහුවචන නාම පද

## 1 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| ගස | - | ගස් |
| මල | - | මල් |
| ගල | - | ගල් |
| අම්මා | - | අම්මලා |
| තාත්තා | - | තාත්තලා |

## 2 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| කුරුල්ලා | - | කුරුල්ලෝ |
| උදැල්ල | - | උදලු |
| බල්ලා | - | බල්ලෝ |
| ගොවියා | - | ගොවියෝ |
| ගවයා | - | ගවයෝ |

## 3 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| පොත | - | පොත් |
| කුඹුර | - | කුඹුරු |
| ළමයා | - | ළමයි |
| ශිෂ්‍යයා | - | ශිෂ්‍යයෝ |
| මම | - | අපි |

## 4 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| පේළිය | - | පේළි |
| කණ්ඩායම | - | කණ්ඩායම් |
| ගුරුවරයා | - | ගුරුවරු |
| රට | - | රටවල් |
| ලේඛකයා | - | ලේඛකයෝ |

## 5 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| සපත්තුව | - | සපත්තු |
| පොකුර | - | පොකුරු |
| කාමරය | - | කාමර |
| දොර | - | දොරවල් |
| නැව | - | නැව් |
| මොනරා | - | මොනරු |
| තරුණයා | - | තරුණයෝ |
| අලියා | - | අලි |
| ජනාධිපතිවරයා | - | ජනාධිපතිවරු |
| කම්කරුවා | - | කම්කරුවෝ |
| මිනිසා | - | මිනිස්සු |
| රිළවා | - | රිළවු |
| දේශකයා | - | දේශකයෝ |
| ධීවරයා | - | ධීවරයෝ |

# පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය මව්බස ගුරුමාර්ගෝපදේශවල ඇතුළත් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන

අකුළා ගන්නවා
අග්ගළා
අධිෂ්ඨානය
අසල ( ළඟ)
අහල පහල
ආකර්ෂණීය
ආපණ ශාලාව
ඇඟිලි
ඇණවුම්
ඇතුළත්
ඇතුළු
ඇසළ
ඇළ
ඉණ
ඉණිමඟ/ ඉණිමග
ඉතුරු

අත්පොළසන්
අදාළ
අලවනවා
උද්ධෘත
උළුවස්ස
එළදෙන
එළවුළු/එළවළු
එළුවා
ඔංචිල්ලාව
ඔළුව
කට්ටඬියා
කණාමැදිරියා
කණ්ඩිය
කතාව/කථාව
කනගාටුව
කම්මැළි

අළුවා
අවුරුල්ල
අව්ව
කළු ගල්
කැකුළු ( මල් )
කැලණි
කැලෑව / කැළෑව
කිලිටි
කුකුළු / කුකුල්
කුරුළු
කොට්ඨාසය
ගමරාල
ගලවනවා
ගවේෂණශීලි
ගව්ව
ගළපනවා

| | | |
|---|---|---|
| ඉදිකටුව | කරණාම් | ගැටලුව |
| ඉනි | කලබ/කලඹ(පොකුර) | |
| ඉහළ | කසළ | ගැහැනිය |
| උච්චාරණය | කළගුණ | ගැළපෙන |
| උදලු | කළමණාකරණය | ගිරවු |
| උදවු | කළු | ගිලුණු |
| ගුළි කිරීම | නළල | පළඟැටියා |
| ගොපලු | නළවනවා | පළල |
| ගොවිපළ/ගොවිපොළ | නළුවා | පළාත |
| ගෝණා | නැළවෙයි | පැල |
| ජ්‍යෙෂ්ඨ | නියළුණු | පැලඳවීම |
| තරග | නිලධාරි | පැළ (කුඩා ගස ) |
| තරණය | නිළිය | පිඟාන |
| තොටුපළ/තොටුපොළ | නෙළාගත් | පිරුළ |
| දණ(දණහිස) | නෙලුම් මල | පිලි |
| දල්ල/දලු | පණ (ප්‍රාණය ) | පිල්ල |
| දහදිය | පණිවිඩය/පණිවුඩය | |
| දැකුම්කලු | පබළු/පබුළු | පිළිගැනීම |
| දිය කඳුර | පරණ | පිළියෙල |

| | | |
|---|---|---|
| දිරනවා | පරිගණක | පිළිවෙළ |
| දූරකථනය/දුරකතනය | පලතුරු | පුලුන් |
| දෙදණ | පලදාව | පුස්තකාලය |
| දෙමව්පියන් | පලඳිනවා | පුළුවන් |
| දේපළ | පලා පැහැය | පෙරළා |
| දොළ | පහළ (යට) | පෙරළෙනවා |
| ජේළිය | යෙහෙළිය | වළවල් |
| පොළඹවනවා | රළ | වැඩපල(විවිධ කාර්ය) |
| පොළොව | රැජින | වැලපෙනවා |
| ප්‍රස්තාව පිරුළු | රැලි/රැළි | වැසිකිළිය |
| ප්‍රහේලිකාව | රිළවු | විද්‍යාලයීය |
| එල ( ගෙඩිය ) | රෙදිපිළි | විශිෂ්ට |
| බරපතළ | ලණුව | විෂ |
| බැබළෙනවා | ලස්සන/ලස්සණ | විහිළුව |
| බැබළුණේ ය | ලියදි | වෙල |
| මග/මඟ | ලිහිණියා /ළිහිණියා | වෙළඳ පළ |
| මඟින්/මගින් | ලුණු | වෙළඳ පොළ |
| මඩ වළක් | වනය | වෙළඹක් |
| මඩුල්ල | වලවේ | ශබ්ද නඟා |

| | | |
|---|---|---|
| මර්දනය | වලසා/වලහා | සත්ත්ව/සත්ව |
| මලානික | වලාකුළ | සන්දර්ශනය/ |
| මාලිගය | වලාකුළු | සංදර්ශනය |
| මාළු / මාලු | වළකනවා | සමග/සමඟ |
| මොනරා | වළලු | සමගිය |
| යහළුවා | වළල්ල | සමනලයා |
| වැඩපළ/(වැඩ කරන තැන) | සමනලයා | උෂ්ණ |
| වැඩපොළ | සලකුණ | ලක්ෂණ |
| සවි කඩදාසිය | ළිප/ලිප | ගවේෂණය |
| සියලු | ළිඳ | පරීක්ෂණය |
| සිවුපදය | සාධාරණ | සෞඛ්‍ය |
| සිවුපාවුන් | කාරණාව | ලේඛනය |
| සිවුවන | තීරණ | ප්‍රමුඛ |
| සුබ/සුබ | පරණ | සංඛ්‍යාව |
| සුළඟ | කොළඹ | හැලප |
| සුළු(ටිකක්) | ආසනය | දේශන |
| සෙමෙන් | හසුන | හුනු පුවරුව |
| සෙවණැල්ල | ආසන්න | ප්‍රශ්න |
| සෙවණ | අත්සන | ළපලු |

| | | |
|---|---|---|
| ස්තුතිය | ප්‍රදර්ශනය | ප්‍රකාශනය |
| හකුළා ගෙන | දර්ශනය ළහිරු | නිරීක්ෂණය |
| කෘතිය | පෘථිවිය | ගෘහය |
| පෘෂ්ඨය | තෘණ | මෘදු |
| වෘත්තය | දෘෂ්ටි | වෘකයා |
| හෘදය | වෘත්තය | දෘශ්‍ය |
| බෲනායි | ඇන්ඩෲ | බෲස්ලි |
| කෲසෝ | බෲස්ලි | ඇන්ඩෲත් |
| බෲස්ලිත් | කෲසෝ | චෛත්‍ය |
| වෛද්‍ය | ධෛර්යය | දෛවය |
| ශෛල | තෛලය | සෛල |
| නෛතික | දෛනික | භෛරව |
| ජෛව | මෛත්‍රිය | කෛරාටික |
| බෞද්ධ | ගෞතම | ලෞකික |
| යෞවන | පෞද්ගලික | මෞලි |
| සෞඛ්‍ය | නෞකාව | ගද්‍ය |
| විද්‍යාව | පද්‍ය | විද්‍යාලය |
| කාව්‍ය | ව්‍යායාම | මාධ්‍ය |
| ව්‍යාපාර | නම්‍ය | ත්‍යාගය |
| වාක්‍ය | සංඛ්‍යාව | |



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි ය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-623 - 1